# සුදුකන්ද - නිකවැව ක්‍රියාබද්ධ පර්යේෂණ වැඩසටහන (ලබාගත් අත්දැකීම්...)

කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් ශ්‍රී ලාංකීය ග්‍රාමීය අංශය ජාතික ආර්ථිකයේ දී වැදගත් තැනක් ගනී. විශේෂයෙන්ම, සුළු වාරිමාර්ග වලින් හෝ අහස් දියෙන් වගා කටයුතු කරන මෙම ගොවීන්ගේ සමාජ - ආර්ථික අභිවෘද්ධිය උදෙසා සෑම රජයක් ම මෙන් විවිධ සංවර්ධන ක්‍රියාදාමයන් දියත් කොට ඇත.

ඒ කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාර්මාර්ග පහසුකම් ඇති ගම්මාන හා සසඳා බැලීමේ දී මෙවැනි ගම්මාන වල ජන ජීවිත නගා සිටුවීම සඳහා එම උත්සාහයන් කොතෙක් දුරට පිටිවහලක් වී ඇත්දැයි සැක සහිත ය. අතීතයේ දී සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ දී ප්‍රවේශය වූ ඉහළ සිට පහලට ගලායන්නා වූ ප්‍රවේශය වෙනුවට පසුකාලීනව පහල සිට ඉහළට ගලායන ප්‍රවේශයක් ක්‍රියාත්මක විය. මෙහි දී, දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණය වන්නේ තීරණ ගැනීමේ සහ සැලසුම් කිරීමේ අවස්ථාවේ සිට ප්‍රතිලාභ භුක්ති විඳීම දක්වා ප්‍රතිලාභී සහභාගිත්වයයි. ප්‍රජා සහභාගිත්වය සංවර්ධන වැඩසටහන් වල තිරසාර බව තහවුරු කිරීමට දායක වන ප්‍රධාන කාරණයකි. ප්‍රජා සහභාගිත්වය මූලික තේමාව කරගත් සහභාගිත්ව ක්‍රියාබද්ධ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් රාශියක්ම මෙම ආයතනය මගින් පසුගිය දශක කිහිපය තුළ දී ක්‍රියාත්මක කොට ඇත. ඒ අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, සුදුකන්ද - නිකවැව ග්‍රාමයේ ආරම්භ කරන ලද වැඩසටහන ද එවන් එක් වැඩසටහනකි.

### තෝරාගත් ගමේ පිහිටීම

සුදුකන්ද - නිකවැව ගම්මානය පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කුඩා ගම්මානයක් වේ. එය ගිරිතලේ රක්ෂිතයට මායිම්ව පිහිටා ඇත. පවුල් 116කින් සමන්විත වූ මෙම ගම්මානයේ ජනගහනය 312ක් විය. කෘෂිකර්මාන්තය ගමේ බහුතරයකගේ ප්‍රධාන ජීවනෝපාය වන අතර කුලී වැඩවල නිරත වීම, ගඩොල් කර්මාන්තය, රක්ෂිතයෙන් දර කපා අලෙවි කිරීම යනාදියෙ හි අතිරේක ආදායම් මාර්ගයන් ලෙස නිරත වී සිටිති. රජයේ රැකියාවල නියුක්ත පිරිස 12 දෙනෙක් පමණක් වූ අතර ඔවුහු ආරක්ෂක අංශවලට අනුයුක්තව සිටිය හ.

ගමේ විශාලත්වය අක්කර 425කි. එය ගොඩ ඉඩම් අක්කර 323ක් හා කුඹුරු ඉඩම් අක්කර 102කින් සමන්විත විය. මෙම ගමේ ගොඩ ඉඩම් සඳහා නීත්‍යානුකූල අයිතිය ලබා නො තිබුණි. ගමේ බහුතරයකට අක්කර 01 වඩා වැඩි ඉඩම් අයිතියක් පැවතිය ද මෙම ගොඩ ඉඩම් නිසි භාවිතයට ගෙන නො තිබුණි. වී වගාවට ජලය සපයන ප්‍රධාන මාර්ගය වූයේ රක්ෂිතයට මායිම්ව පිහිටි "නිකවැව" වැවයි. සුළු වාරිමාර්ග පහසුකම් යටතේ වගා කටයුතු සිදුකරන ගම්මානයක් වීමත්, ප්‍රදේශයේ ඇති වාරි පහසුකම් ඇති වෙනත් ගම්මාන හා සසඳා බැලීමේ දී සමාජ - ආර්ථික අතින් පහත් තත්ත්වයක පැවතීමත් යන කරුණු මේ ගම තෝරා ගැනීමට ප්‍රධාන හේතු ලෙස සඳහන් කළ හැකි ය.

### වැඩසටහනේ ප්‍රධාන අරමුණ

සුළු වාරිමාර්ග වලින් පෝෂිත කෘෂි ඉඩම් වලින් යුත් මෙම ගම්මානයේ ස්වාභාවික සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම මගින් ජනතාවගේ ජීවන තත්ත්වය වර්ධනය කරවීම දිගුකාලීන අරමුණ විය. මෙම වැඩසටහනේ කෙටිකාලීන අරමුණ වූයේ ප්‍රජාවගේ සහභාගිත්වයෙන් හඳුනා ගන්නා ගැටළු සඳහා විසඳුම් ලබාදීමේ අදාළ වැඩසටහන් ක්‍රියාවට නැංවීමයි.

ඒ අනුව, කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, කෘෂි හා කෘෂි නොවන රැකියා අවස්ථා ඇතිකිරීම, වාණිජ බෝග වගාවන්ට යොමු කිරීම හා නව තාක්ෂණ ක්‍රම පිළිබඳව දැනුම හා කුසලතා වර්ධනය, ආයතනික සංවර්ධනය මෙන් ම හැකියා වර්ධනය කිරීම මේ යටතේ විශේෂිත අරමුණු විය.

### ක්‍රමවේදය

මේ අරමුණු කරා ළඟා වීම සඳහා පහත දැක්වෙන උප වැඩසටහන් 04 ඔස්සේ වැඩසටහන ක්‍රියාවට නැගිණි.

1. කෘෂිකාර්මික ඵලදායීතාවය ඉහළ නැංවීමේ වැඩසටහන
2. කෘෂි හා කෘෂි නොවන ආදායම් උත්පාදන වැඩසටහන
3. යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන
4. පාරිසරික සම්පත් කළමනාකරණ වැඩසටහන

ගමේ ප්‍රජාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමත්, ඒ සඳහා විසඳුම් යෝජනා කරමින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමත්, ප්‍රජාව විසින් ම සිදුකිරීම මෙහි දී විශේෂත්වයකි. පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් රාජ්‍ය නිලධාරීන් හා මෙම ගමේ ප්‍රජාව සමග සිදු කළ 'සහභාගිත්ව ගැමි පිවිසුම්' අභ්‍යාසයක් මගින් මෙම කරුණ සිදු කරන ලදී.

**සුදුකන්ද නිකවැව ගම්මානයේ හඳුනාගත් ගැටළු සහ ක්‍රියාත්මක කල වැඩසටහන් සමහරක් පහත සටහන් වේ.**

**හඳුනාගත් ගැටළු**

ගම ආරම්භයේ සිට මේ දක්වා රාජ්‍ය අංශයේ විමධ්‍යගත අරමුදල් වලින් හා විවිධ ව්‍යාපෘති මගින් ආරම්භ කරන ලද විවිධ සංවර්ධන වැඩසටහන් යටතේ යටිතල පහසුකම් වැනි සංවර්ධන ප්‍රතිලාභයන් කිහිපයක්ම පසුගිය වකවානුව තුළ දී ගමට ලැබී තිබුණි. ඒ යටතේ විදුලිබලය, ග්‍රාමීය පාරවල් යන ප්‍රධාන යටිතල පහසුකම් ගමට ලැබී තිබුණ ද තම ආර්ථික වර්ධනයට සෘජුව බලපාන්නා වූ පොදු ගැටළු රාශියකට මෙම ගම්වාසීන්ට මුහුණු දීමට සිදු වී තිබුණි. එනම්, ගම්වාසීන්ගේ ආර්ථික සංවර්ධනය උදෙසා කෘෂි සංවර්ධනය ඉලක්ක වූ වැඩසටහන් ක්‍රියාත්මක නොවීම මෙම ගැටළුවලට මූලික හේතුව වී තිබුණි. සහභාගිත්ව ගැමි පිවිසුම් වැඩමුළුවේ දී එවැනි ගැටළු රාශියක් හඳුනා ගත හැකි වූ අතර පහත දැක්වෙන ගැටළු එහි දී ප්‍රමුඛස්ථානයක් ගන්නා ලදී.

**i කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ප්‍රමාණවත් නොවීම**

සුදුකන්ද - නිකවැව ගමේ පිහිටා ඇති නිකවැව වැව සුළු වාරිමාර්ගයක් වන අතර නිසි ප්‍රතිසංස්කරණයක් නොමැති නිසා කන්න දෙකක් වගා කිරීමට තරම් ප්‍රමාණවත් ජලය රැඳී නො පවතින බැවින් වැව යටතේ සිදුකරන වී වගාව මහ කන්නයට පමණක් සීමා වී ඇත. ප්‍රමාණවත් වැසි ලැබුණත් වැවේ රැඳෙන ජල ප්‍රමාණය අඩු නිසා මහ කන්නයේ ද, වී වගාව අවිනිශ්චිත තත්ත්වයකට පත් වේ.

**ii. වල් අලි උවදුර**

ගම එක් පැත්තකින් රජයේ වන රක්ෂිතයට මායිම් වී ඇත. රක්ෂිතයට මායිම් ආකාරයට ඉදිකර තිබූ විදුලි වැට විනාශ වී ඇති බැවින් ගම්වාසීන් නිතර වල් අලි උවදුරට ලක්වීම ප්‍රධාන ගැටළුවකි. දර කැපීම සඳහා රක්ෂිතයට ඇතුළු වන්නන් හා දඩව ජාවාරම්කරුවන්ගේ ක්‍රියා හේතුවෙන් හා විදුලිවැට ආරක්ෂා කිරීමට පියවර නො ගැනීම මත විදුලි වැට විනාශ වී ඇති බව දැනගන්නට ලැබුණි.

**iii. නව කෘෂිකාර්මික දැනුම නො ලැබීම - ව්‍යාප්ති සේවාවන් නිසි පරිදි නො ලැබීම**

ගම්වැසියන් පවසන ආකාරයට නව කෘෂිකාර්මික දැනුම ලබා ගැනීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් සහ ව්‍යාප්ති සේවා නිසි පරිදි නො ලැබීම හේතුවෙන් ඔවුහු සාම්ප්‍රදායික දැනුමෙන් කෘෂිකාර්මික කටයුතුවල යෙදී සිටිති. "අපි වවමු – රට නගමු" වැඩසටහන යටතේ ගෙවතු සංවර්ධන වැඩසටහන් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස.)ගේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක වුවත් එය තාක්ෂණික දැනුම ලබාදීමේ වැඩසටහනක් නොව වගාව සඳහා අවශ්‍ය බීජ ලබා දී ගොවිතැනට උනන්දු කිරීමක් පමණක් විය.

**iv මිරිදිය ධීවර කර්මාන්තය ආශ්‍රිත ගැටළු**

සුදුකන්ද වැව හා ගම අසල පිහිටි වැව් ආශ්‍රිතව ගමේ පවුල් 10ක් පමණ අර්ධ කාලීනව මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදී සිටිය ද, රාජ්‍ය ආයතන අනුග්‍රහය මෙම ධීවර කර්මාන්තයට ලැබෙන්නේ නැත. වසර කිහිපයකට පෙර ධීවර සමිතියක් ආරම්භ කොට ඇතත්, එය ද, වර්තමානයේ ක්‍රියාත්මක භාවයේ නො පවතී. ධීවර උපකරණ හිඟකම, ධීවර සමිතියක් නොමැතිකම, තාක්ෂණය නොමැතිකම වැනි විවිධ ගැටළු රාශියක් මධ්‍යයේ ඔවුහු එම කර්මාන්තයේ යෙදී සිටිති.

**iv. රැකියා අවස්ථාවන් නොමැතිවීම**

අතිරේක ආදායම් සඳහා රැකියා අවස්ථාවන් නොමැතිකම තවත් ප්‍රධාන ගැටළුවක් ලෙස පෙන්වා දිය හැකි ය. මහා වාරිමාර්ග යටතේ වී වගා කටයුතු සිදුකරන කාලයන්හි දී ද, මහ කන්නයේ දී ගම තුළ ද ශ්‍රම ඉල්ලුමේ වැඩිවීමක් දක්නට ලැබේ. එසේ තාවකාලික රැකියා අවස්ථා ඇති වුවත්, දීඝු කාලයක් පවතින වියළි කාලය තුළ දී මෙම ගමේ රැකියා හිඟතාවයක් දක්නට ලැබේ. කෘෂිකාර්මික රැකියා අවස්ථා හිඟ වන විට ආදායම් ලබා ගැනීම සඳහා අසල පිහිටි රක්ෂිතයෙන් දර කපා අලෙවි කිරීම, ගඩොල් කර්මාන්තය ආදිය ප්‍රධාන ආදායම් මාර්ගයන් ලෙස තෝරා ගනී. මෙම ගැටළුවලට අමතරව තවත් ගැටළු රාශියක් හඳුනා ගත හැකි වූ අතර ඉහත දැක් වූ ප්‍රධාන ගැටළු ගමේ ජනතාව මුහුණ

දෙන දරිද්‍රතාවයට සෘජුව හේතුවන්නා වූ ගැටළු බව පැහැදිළිව දැකගත හැකි විය.

ක්‍රියාබද්ධ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීම ප්‍රධාන අවශ්‍යතාවයක් විය. මෙම සැලැස්ම ප්‍රජාවගේ සහභාගිත්වයෙන් ඔවුන් විසින්ම සකස් කරවීමට පියවර ගනු ලැබී ය.

## වැඩසටහන ක්‍රියාත්මක කිරීම

ක්‍රියාත්මක සැලැස්මට අයත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම සඳහා කමිටු 02ක් පත් කරන ලද අතර එම කමිටුවලට පහත සඳහන් වගකීම් පවරා දෙන ලදී.

### 1. ග්‍රාමීය ප්‍රජා ක්‍රියාකාරී කමිටුව

ගමේ දැනට පවතින විවිධ ප්‍රජා සංවිධාන නියෝජිතයන්ගෙන් සමන්විත මෙම කමිටුව, ග්‍රාමීය මට්ටමේ දී ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමට සහාය වීමත්, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය මෙන් ම වැඩසටහන් සඳහා ජනතාවගේ දායකත්වය ලබා ගැනීම සිදු කරයි.

### 2. මෙහෙයුම් කමිටුව

ග්‍රාමීය මට්ටමේ රාජ්‍ය නිලධාරීන් වන ග්‍රාම නිලධාරී, කෘ.ප.නි.ස හා සමෘද්ධි නිලධාරීගෙන් සමන්විත මෙම කමිටුව, වැඩසටහන් අධීක්ෂණ කටයුතු, මෙහෙයවීම මෙන් ම පහසුකම් සපයන්නෙකු ලෙස ද කටයුතු කරනු ලබයි.

එමෙන් ම, ග්‍රාමීය ගොවි ජනතාවගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් ම ක්‍රියාත්මක වන ගොවි සංවිධානයේ සහාය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වැඩි දායකත්වයක් ලබා ගැනීමට සැලසුම් කෙරුණි. ඒ අනුව, ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩ සඳහා "ප්‍රජා සහභාගිත්වය" ලබා ගැනීම ගොවි සංවිධානයේ ප්‍රධාන වගකීම විය.

## ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

ක්‍රියාත්මක සැලැස්ම අනුව ගමේ ප්‍රජාවට දැඩිව බලපාන්නා වූ ප්‍රධාන ගැටළු කිහිපයකට විසඳුම් ලබාදීමේ අරමුණින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලැබුණි. මේ සඳහා ප්‍රදේශයේ රාජ්‍ය ආයතනවල සහය ලබා ගන්නා ලදී.

### 1. සුදුකන්ද වැව ප්‍රතිසංස්කරණය සඳහා ආයතන වෙත යොමු කිරීම

වැඩසටහන ආරම්භයේ දී ගොවීන්ගේ ප්‍රධාන ඉල්ලීම වූයේ වැව ප්‍රතිසංස්කරණය කර ගැනීමයි. ක්‍රියාබද්ධ පර්යේෂණ වැඩසටහන යටතේ මේ සඳහා මැදිහත්වීමක් කළ අතර මේ සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අවධානය යොමුකරවීම වැඩසටහන මගින් සිදු කරන ලදී.

### 2. ධීවර වැඩසටහන

මෙම ගමේ ධීවර කාර්මිකයන් ඒකරාශි කර ධීවර සමිතියක් ගොඩනැගීමට පියවර ගැනුණි. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අනුග්‍රහය මේ සඳහා ලබා ගත හැකි විය. සුදුකන්ද වැව සහ මෙම ගම අසල රක්ෂිතයේ පිහිටා ඇති රඹෑව වැව ආශ්‍රිතව මෙම ධීවර වැඩසටහන ආරම්භ කරන ලද අතර මේ සඳහා මාලු පැටවුන් 9000ක් එම අධිකාරිය විසින් නොමිලයේ ලබා දෙන ලදී. එම නිලධාරීන් මගින් අවශ්‍ය තාක්ෂණ පුහුණුව ද කාර්මිකයනට ලබාදීමට හැකි විය. වැවට මුදා හරින මාළුන් රැක ගැනීම හා ආදායම ලැබීම ධීවර සමිතිය සතු වූ අතර සමිතිය ශක්තිමත් වී මෙම ව්‍යාපෘතිය තිරසාරව ඉදිරියට පවත්වා ගෙන යාම මෙමගින් අපේක්ෂිත ප්‍රධාන කරුණකි.

### 3. ස්වයං රැකියා වැඩසටහන (කාන්තා)

i. රැකියා විරහිත කාන්තාවන් සඳහා කෘෂි පාදක ස්වයංරැකියා හඳුන්වා දීම යටතේ ආරම්භයක් වශයෙන් බිම්මල් වගා පුහුණු වැඩසටහනක් පැවැත්වීමට පියවර ගන්නා ලදී. ඒ සඳහා කාන්තාවන් 30 දෙනෙකු සහභාගී විය. පුහුණුව අවසානයේ කාන්තාවන් 10 දෙනෙකු බිම්මල් වගාවට යොමු විය. ආරම්භයේ දී අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය මෙම වැඩසටහනේ ප්‍රතිපාදන වලින් ලබාදීමට පියවර ගැනුණි. වගාව සඳහා අවශ්‍ය කුඩා මඩුවක් සකස් කර ගැනීම ඔවුන්ගේ දායකත්වයෙන් සිදු විය. මෙමගින් කාන්තාවන් 08 දෙනෙකු සාර්ථකව බිම්මල් වගාව කර ගෙන යන ලද අතර ඔවුන්ගේ නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට ද හැකියාව ලැබුණි.

### ii. මී මැසි පාලන වැඩසටහන

මී මැසි පාලනය පිළිබඳ දැනුම ලබාදීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ප්‍රායෝගික පුහුණු වැඩසටහන් කිහිපයක් ම පවත්වන ලද අතර ඒ යටතේ කාන්තාවන් 10 දෙනෙකු ඊට සහභාගීවීමට ඉදිරිපත් විය. පුහුණුවෙන් පසු ව්‍යාපෘතිය යටතේ මී මැසි පෙට්ටි නො මිලේ ලබා දෙන ලදි.

### iii. සත් ව පාලන වැඩසටහන (කුකුල් පාලනය)

කුකුල් පාලනයට කැමැත්තක් දක්වන කාන්තාවන් සඳහා කුඩා පරිමාණයෙන් කුකුල් පාලනය සඳහා අවශ්‍ය දැනුම මෙන් ම එක් අයෙකුට පැටවුන් 10 දෙනෙකු බැගින් ද ලබා දෙන ලදී.

### 4. ගෙවතු පොල් වගා වැඩසටහන

මෙම ගම හා රක්ෂිතය අතර ආරක්ෂිත විදුලි වැට සකස් කරමින් පවතින නිසා වල් අලි හානි අවදානම පහව යන බැවින්, ගෙවතු වල පොල් වගා කිරීමේ වැඩසටහනක් ඇරඹීමේ හැකියාව තිබුණි. ගම්මානයේ සියළු ගෙවතු ඉලක්ක කර ගනිමින් ගෙවතු පොල් වගා වැඩසටහන ආරම්භ කළ අතර පොල් සංවර්ධන මණ්ඩලය විසින් නො මිලයේ පොල් පැළ 375ක් ලබා දී ක්‍රමවත්ව පොල් පැළ සිටුවීම පිළිබඳ හා පොහොර භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් ද පැවැත් විය. මෙයට අමතරව සහනාධාර ක්‍රමය යටතේ පොල් වගාවට ඉදිරිපත් වුවන් සඳහා තාක්ෂණ දැනුම ලබා දී පැළ ලබා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම සිදු කිරීමට ද හැකියාව ලැබුණි. මේ සඳහා අක්කර 1/2 ප්‍රමාණයේ ඉඩම්ලාභීන් 07 දෙනෙකු ඉදිරිපත් විය.

### 5. කෘෂිකාර්මික මාර්ග ප්‍රතිසංස්කරණය

තිකවැව ගම්මානයේ ප්‍රධාන කුඹුරු යායට පිවිසෙන එමෙන් ම, පවුල් 23කට සෙත සැලසෙන කුඩා කෘෂිකාර්මික මාර්ග දෙකක් ඉදිකිරීමේ අවශ්‍යතාවය ගම්මුන් විසින් පෙන්වා දුන් අතර ගොවි සංවිධානයේ ඉල්ලීම මත ප්‍රජා සහභාගීත්වයෙන් පාර ඉදිවිය. කෘෂි පාර සඳහා බොරළු දැමීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ, වැඩසටහනේ ප්‍රතිපාදන වලින් ලබා දුන් අතර ප්‍රජා සහභාගිත්වය ලබාදීම ගොවි සංවිධානය විසින් සිදුකරණ ලදි. මේ සඳහා ගම්වාසීන් 50 දෙනෙකු පමණ දින දෙකක් තුළ ශ්‍රමය සපයා දෙනු ලැබී ය.

### 6. කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන

මේ යටතේ කාබනික පොහොර සෑදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් කිහිපයක් ම පවත්වන ලදී.

## බාධාවන් හා සීමාවන්

වැඩසටහන ආරම්භ කර ක්‍රියාත්මක කරන අවස්ථාවේ දී විවිධ අභියෝග හා ගැටළු කිහිපයකට මුහුණ දීමට සිදුවිය. එම බාධාවන් හා අභියෝග හමුවේ වැඩසටහන අඛන්ඩව ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබුව ද, එය වැඩසටහනේ සාර්ථකත්වයට යම් තරමක බාධා ගෙන දීමට හේතු විය. මෙහි දී මුහුණ දීමට සිදු වූ ප්‍රධාන බාධාවන් කිහිපයකි.

### i. ප්‍රජා සහභාගිත්වය අවම වීම

වැඩසටහන ආරම්භයේ දී ප්‍රජාව විසින් ඉදිරිපත් කරන ලද ගැටළුවක් වූයේ රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය මෙම ප්‍රජාවට නො ලැබෙන බවකි. ග්‍රාමීය කෘෂි කර්මාන්තයේ සංවර්ධනයට එය බාධාවක් බව පෙන්වීමට ඔවුහු උත්සාහ ගත් හ. වැඩසටහන මගින් කෘෂි ව්‍යාප්ති සේවයේ සහාය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ලබා දුන්නත් ගොවීන්ගේ සහභාගිත්වය ඉතා අවම මට්ටමක පැවතුනි. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් විවිධ වැඩසටහන් ආරම්භ කර අතරමග අතහැර දැමීමේ පූර්ව අත්දැකීම් මෙයට හේතු විය. එම හේතුව නිසා මෙම වැඩසටහන කෙරෙහි ද විශ්වාසයක් ඔවුන් තුළ ගොඩනැගී තිබුණේ නැත. ග්‍රාමීය ක්‍රියාකාරී කමිටුව රැස් නොවීම, එමෙන් ම, ක්‍රියාත්මක කල වැඩසටහන් වල දී ප්‍රජා සහභාගිත්වය අඩුවීම දක්නට ලැබුණු ප්‍රධාන බාධාවක් විය.

### ii. දේශපාලනමය මැදිහත් වීම

ගමේ ප්‍රධාන ගොවි සංවිධානය එහි නායකයන්ගේ අවශ්‍යතා මතම ක්‍රියාත්මක වීම පෙනෙන්නට තිබුණි. එසේ වූයේ ප්‍රාදේශීය දේශපාලනඥයන්ගේ මැදිහත්වීම ගොවි සංවිධාන කටයුතු කෙරෙහි බලපා තිබූ බැවිනි. එබැවින්, සංවිධානයේ සාමාජිකත්වය ඉදිරිපත් කරන යෝජනා අභිබවා ප්‍රාදේශීය දේශපාලනඥයන්ගේ මතය ක්‍රියාවට නැංවූ අවස්ථා දක්නට ලැබුණි. මෙයට අමතරව, මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල දී මෙන් ම පොදු රැස්වීම්වල දී ද, එයට දේශපාලනික මුහුණුවරක් දීමට අනියම් ආකාරයන්ගෙන් මැදිහත්වීමට කටයුතු කිරීම, විරුද්ධ මත දරන්නන්ගේ සහභාගිත්වය මෙම වැඩසටහනට නො ලැබීමට හේතුවක් විය. ගොවි සංවිධානයේ නායකත්වයට පොදු තීරණ මත පිහිටා ස්වාධීනව වැඩ කිරීමට නො හැකි තත්ත්වයක් ඇති වී තිබුණි. මේ තත්ත්වය ග්‍රාමීය මට්ටමේ රාජ්‍ය නිලධාරීන්ට ද සාධාරණව වැඩසටහනට මැදිහත් වීමට බාධාවක් විය.

### iii. යැපුම් මානසිකත්වය

සමාජය තුළ පොදුවේ දක්නට ලැබෙන එමෙන් ම, දිගු කාලයක් තිස්සේ මුල් බැසගෙන ඇති යැපුම් මානසිකත්වය සුදුසකන්ද ගමේ ප්‍රජාව තුළ ද දක්නට ලැබුණි. රජයෙන් හෝ ආයතනයකින් ලබාදෙන යම් ප්‍රතිපාදනයක් ගැන පමණක් බලාපොරොත්තු තබා ගෙන සිටීම මෙම වැඩසටහනට වූ ප්‍රධාන බාධාවක් විය. ප්‍රජාවගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය සඳහා වන ක්‍රියාත්මක කළ විවිධ වැඩසටහන් වලට දැක් වූ අඩු සහභාගිත්වය මගින් එය මනාව පැහැදිළි විය.

### iv. ගොවි සංවිධානයේ දුර්වල නායකත්වය

ප්‍රජාව රැස්කර ගැනීම, ඔවුන්ට නායකත්වය දීම, තීරණ ගැනීම වැනි කාර්යයන් හි දී, ගොවි සංවිධානයේ නායකත්වය දුර්වල ලක්ෂණ පෙන්වීම මෙවැනි ක්‍රියාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑමට සිදුවන බලවත් බාධාවකි. මෙම ගොවි සංවිධානයේ ද දක්නට ලැබුනේ එවැනි තත්ත්වයකි. සාමාජිකයන් නායකත්වයට විරුද්ධව යන අවස්ථා ද දක්නට ලැබුණි. එසේම, නායකත්වය බාර ගැනීමට කිසිවෙක් උනන්දුවක් දක්වන්නේ නැති බවක් ද දැකිය හැකි විය.

### v. සියළු සංවර්ධන කාර්යයන් නිලධාරීන් හෝ ප්‍රජා නායකයන් විසින් හෝ කළ යුතු යැයි යන මතයෙ හි පිහිටා තිබීම

මෙම ප්‍රජාවගේ සමාජ - ආර්ථික අභිවෘද්ධිය සඳහාත් දැනුම, කුසලතා වර්ධනය සඳහාත්, මෙම ක්‍රියාබද්ධ වැඩසටහන තුළින් හඳුන්වා දෙන ලද ක්‍රියාකාරකම් තිරසාරව පවත්වා ගෙන යාමට ඔවුන් දැක්වූයේ අඩු උනන්දුවකි. ප්‍රජාවගෙන් බහුතරයකගේ බලාපොරොත්තුව වූයේ නිලධාරීන්ගේ මැදිහත් වීම හා අවශ්‍ය යෙදවුම් රජය මගින් ම ලබා දීමක් කළ යුතු බව ය. කොම්පෝස්ට් වැඩසටහන, ගෙවතු වගා වැඩසටහන සහ බිම්මල් වගා කිරීමේ වැඩසටහන තුළ එය හොඳින් දක්නට ලැබුණි. ආරම්භයේ දී විශාල වශයෙන් සහභාගී වීමට උනන්දුවක් දැක්වූව ද, එය තිරසරව ක්‍රියාත්මක කරන පිරිස ක්‍රමයෙන් අඩුවීමක් දක්නට ලැබුණි.

### vi. ගම්වැසියන් අතර එකමුතුකම අඩුවීම

ගම්වැසියන් අතර සම්බන්ධතා අඩු තත්ත්වයක පැවතීම ද දක්නට ලැබුණි. සාමාජිකයන් අතර සම්බන්ධතාවය අඩුවීමට හේතුවක් වන්නේ ඔවුන් අතර පවතින පෞද්ගලික අමනාපකම් බව පෙනෙන්නට තිබුණි. එබැවින්, සමිති සමාගම්වල දී ද, ඔවුන්ගේ සම්බන්ධතාවය අඩු විය. ඒ හේතුව නිසා සම්බන්ධතා පැවැත්වීම අඩු තත්ත්වයක පැවතුනි.

### vii. උත්ප්‍රේරක කාර්ය ප්‍රමාණවත් නොවීම

දිගු කාලයක් ප්‍රජාව තුළ මුල් බැසගත් යැපීම් මානසිකත්වයෙන් මෙම ප්‍රජාව බැහැර කරවීමට අවශ්‍ය වන්නා වූ සජීවීකරණ කාර්යභාරය බලාපොරොත්තු වූයේ "ග්‍රාමීය මෙහෙයුම් කමිටුව" තුළිනි. ඒ සඳහා ප්‍රජාව බල ගැන්වීම ග්‍රාමීය කමිටුව මගින් ඉටුවිය යුතු වුවත්, එය එලෙස සිදු වූයේ නැත. එයට ප්‍රධාන හේතුව වූයේ එම කමිටුව සමන්විතව වුවත් තමන් රාජ්‍ය නිලධාරීන් ලෙසම සිතා කටයුතු කිරීමයි. ගැමියන් විසින් ද ඔවුන් හඳුනාගෙන ඇත්තේ රාජ්‍ය සේවකයන් ලෙස බැවින් ඔවුන්ගේ උත්ප්‍රේරක කාරයභාරයේ සාර්ථක තත්ත්වයක් දක්නට නො ලැබුණි. ගොවි ප්‍රජාව බලගැන්වීමේ කාර්යභාරය නිසි ලෙස ඉටු නොවීමේ ප්‍රධාන හේතු ලෙස එය පෙන්වා දිය හැකි ය.

### viii. ආදායම් උත්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා මූල්‍යමය හා ද්‍රව්‍යමය පහසුකම් ප්‍රමාණවත් නොවීම

ආදායම් උත්පාදන ස්වයං රැකියා වැඩසටහන් හඳුන්වා දීම හා තාක්ෂණ පුහුණුව ලබාදීමට හැකියාව ලැබුනත් ඒ සඳහා ද අවශ්‍ය වන මූලික ප්‍රතිපාදන සොයා ගැනීමට හැකියාවක් නොමැතිවීම එම ප්‍රතිලාභීන් මුහුණදුන් ප්‍රධාන ගැටළුවක් විය. මෙම වැඩසටහන තුළින් ලබාදුන් යෙදවුම් ප්‍රමාණවත් වූයේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පමණි.

### ix. ගොවීන්ගේ ප්‍රධාන ගැටළු වලට විසඳුම් නො ලැබීම

වියළි කලාපයේ මෙවැනි ගමක ගොවීන්ගේ ප්‍රධාන අවශ්‍යතාවය වන්නේ ජලයයි. ඒ සඳහා නිසි විසඳුම් ලබාදීමට මෙවැනි සුළු වැඩසටහනකින් හැකියාවක් ද නොමැත. එවැනි ගැටළු රජයේ අවධානය පිණිස යොමු කිරීම පමණක් ව්‍යාපෘතිය මගින් සිදුකලත්, ඒ සඳහා අදාළ ආයතන එයට නිසි ක්‍රියාමාර්ගයක් නො ගැනීම නිසා මෙවැනි වැඩසටහන් කෙරෙහි විශ්වාසය බිඳ වැටීම ගොවි සහභාගිත්වය ලබා ගැනීමට බාධාවක් විය.

## වැඩසටහන තුළින් ලබාගත් අත්දැකීම්

1. සුදුකන්ද ග්‍රාමයේ ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වයන් වර්ධනය කිරීමේ අරමුණ කරා ළඟා වීම සඳහා ආරම්භ කළ වැඩසටහන් වලින් එහි දිගුකාලීන අරමුණ වන ජනතාවගේ ආර්ථික වර්ධනයක් සිදුවී ද යන්න විශ්ලේෂණය කර බැලීමට තරම් අවස්ථාවක් නො ලැබුණි. එසේ වූයේ වැඩසටහන ආරම්භ කොට දිගු කාලයක් ගත නොවීම නිසාවෙනි. කෘෂිකාර්මික හා වෙනත් ආදායම් උත්පාදන වැඩසටහන් ආරම්භ කිරීමට හැකි වූයේ ද 2008/2009 මහ කන්නයේ ආරම්භයත් සමඟිනි. එමෙන් ම, මෙම වැඩසටහන් තුළින් සමාජමය බලපෑමක් ඇති වූ බව පෙනෙන්නට තිබුණි. රජයේ ආයතන ක්‍රියාත්මක කරන කෘෂි ව්‍යාපාර පිළිබඳව අවබෝධයක් ඇතිවීම සහ ආදායම් උත්පාදන වැඩසටහන් කෙරෙහි උනන්දුවක් ඇතිවීම මෙන් ම කෘෂිකාර්මික අංශයෙන් නව ප්‍රබෝධයක් ඇතිවීම ගම්වාසීන් ලද එවැනි ප්‍රතිලාභයන් ලෙස පෙන්වා දිය හැකි ය.

2. ව්‍යාපෘති කාලය තුළ දී පැවති දිගු නියගය නිසා සෘජු ප්‍රතිලාභ ඇතිවන කෘෂිකාර්මික වැඩසටහන් කිසිවක් ආරම්භ කිරීමට හැකියාව නො ලැබුණි. එබැවින්, එම කාලය තුළ දී වැව ප්‍රතිසංස්කරණය, කෘෂි පාරවල් සකස් කිරීම වැනි යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන හා ධීවර සමිති ගොඩනැගීම, කාන්තා සමිතියක් පිහිටුවීම හා පවතින ගොවි සංවිධානය ශක්තිමත් කිරීම වැනි ආයතනික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මුල් තැනක් ලබා දෙන ලදී. එසේ තම අවශ්‍යතාවයන් මත කණ්ඩායම් ගොඩ නගා ගැනීමට ඔවුන් අතරම උනන්දුවක් ඇතිවීමත්, එසේ සංවිධානගත වීමට පෙළඹවීමත්, මෙම වැඩසටහන තුළින් ලබාගත් ප්‍රතිලාභයක් ලෙස පෙන්වාදිය හැකි ය. ගම්මුන්ගේ හැකියාවන් වර්ධනය වීමත්, මෙම ක්‍රියාබද්ධ වැඩසටහන් තුළින් ප්‍රජාව ලබාගත් තවත් එවැනි ප්‍රතිලාභයකි.

3. ග්‍රාමය තුළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී දක්නට ලැබුණු සුවිශේෂී ලක්ෂණයක් වූයේ කාන්තා දායකත්වය ඉහළ මට්ටමක පැවතීමයි. එබැවින්, ගෘහස්ථ කටයුතුවල පමණක් යෙදී සිටින කාන්තාවන් ඉලක්ක කර වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම, එම වැඩසටහන්වල සාර්ථකත්වයට හේතු වන්නක් බව පෙනෙන්නට තිබුණි. බිම්මල් වගාව මඟින් මසකට රු: 4000/- පමණ ආදායමක් ලබා ගැනීමට ද, මෙහි කාන්තාවන්ට හැකියාව ලැබීමෙන් පෙනී යන්නේ කාන්තාවන්ගේ උනන්දුව ඉස්මතු කර, ඔවුන් දිරිගැන්වීම තුළින් මෙවැනි වැඩසටහන් සාර්ථකව කළ හැකි බවයි. සාර්ථකව ක්‍රියාත්මක වූ ස්වයං රැකියා යටතේ කුකුල් පාලන වැඩසටහනේ දී ද, බිම්මල් වගාවේ දී ද, කාන්තාවන්ගේ කැපවීම හා අවශ්‍යතාවය තුළින් සාර්ථකත්වය කරා ළඟා වී ලැබුණි.

4. ග්‍රාමීය ප්‍රජාවට සේවා සැපයීම සඳහා පිහිටුවා ඇති විවිධ රාජ්‍ය ආයතන නිලධාරීන් හා ගමේ ප්‍රජාව අතර සම්බන්ධතා වර්ධනය වීමටත්, බිඳ වැටී තිබූ විශ්වාසයන් නැවත ගොඩ නගා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ඇති වීමත්, මෙම වැඩසටහන තුළින් ඇති වූ යහපත් ප්‍රතිඵලයක් ලෙස පෙන්වා දිය හැකි ය. ලබාදුන් පුහුණු වැඩසටහන් මඟින් ප්‍රජාවගේ හැකියාවන් වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසුණි. එසේම, විවිධ ආයතන මඟින් ක්‍රියාත්මක කරන ව්‍යාප්ති සේවාවන් ඔස්සේ ලබා ගත හැකි විවිධාකාර සේවාවන් පිළිබඳව ගම්වාසීන් හට දැනුම හා අවබෝධය ලබා ගැනීමට අවස්ථාවක් ලැබීම ද වැඩසටහන තුළින් ලද තවත් ප්‍රතිලාභයකි.

5. ඉලක්කගත කණ්ඩායම් නිවැරැදිව හඳුනා ගැනීම ඕනෑම වැඩසටහනක් සාර්ථක කර ගැනීමේ දී වැදගත් වන බව මෙම වැඩසටහන තුළින් මනාව තහවුරු විය. එබැවින්, ඉලක්කගත ප්‍රතිලාභීන් හඳුනා ගැනීමත්, ඔවුන්ගේ අවශ්‍යතාවයන් හඳුනා ගෙන ඒ අනුව සංවර්ධන වැඩසටහන් දියත් කිරීම විශේෂයෙන්ම, ආදායම් උත්පාදන වැඩසටහන් වල දී වඩාත් සුදුසු වන ක්‍රමෝපායය කි. ඉලක්කගත කණ්ඩායම් තෝරා ගැනීමේ කාර්යය, වැඩසටහන් ක්‍රියාවට නගනු ලබන ප්‍රජා කමිටු හා ප්‍රජා සංවිධාන හරහා ක්‍රියාත්මක කිරීමට හැකියාව පවතී. තෝරා ගත් ව්‍යාපෘති සඳහා ඔවුන් දක්වන කැමැත්ත, ශ්‍රමය මෙන් ම කාලය යෙදවීමේ ඇති හැකියාව හා සම්පත් හිමිකම වැනි නිර්ණායකයන් සලකා මෙවැනි ප්‍රතිලාභීන් තෝරා ගැනීම වඩාත් සුදුසු ය.

6. මෙවැනි වැඩසටහනක් තුළින් කෙටිකාලීන අරමුණු ළඟා කර ගැනීමට වඩා තිරසාර සංවර්ධන ක්‍රියාදාමයකට මුල්තැන දීමත්, ඒ සඳහා ප්‍රජාව යොමු කරවීමත් වැදගත් වේ. ඒ සඳහා අවශ්‍ය වන්නේ සුදුසු ග්‍රාමීය සංවිධාන රාමුවක් ගම තුළ පැවතීමයි. එබැවින්, ප්‍රජා සංවිධාන ශක්තිමත් කර ක්‍රියාත්මක වීමට අවශ්‍ය ආයතනික සහාය ලබාදීම වැදගත් වන්නේ ය.

7. අධ්‍යාපනය හා පුහුණුව යම් ප්‍රජාවකගේ ජීවන තත්ත්වය වර්ධනය සඳහා ඉවහල් වන ප්‍රධාන මෙවලම් දෙකකි. එය රාජ්‍ය ආයතනවලට තම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පහසුවක් වේ. ප්‍රජාවගේ සංවිධානාත්මක හැකියාවන් හා විශ්වාසයන් වර්ධනය කිරීම. අධ්‍යාපනය හා පුහුණුව මගින් ලබාදිය හැකි ය.

8. මෙවැනි ක්‍රියාබද්ධ වැඩසටහනක දී වැඩි දෙනෙකුගේ විශ්වාසය ගොඩ නගා ගැනීම අත්‍යාවශ්‍ය වන්නා සේ ම එය ප්‍රායෝගික අවශ්‍යතාවයකි. එබැවින්, ප්‍රජාව එකතු කිරීම සඳහා විවිධ කණ්ඩායම් ඉලක්ක කල වැඩසටහන් ආරම්භ කිරීම මෙහි දී ප්‍රධාන අරමුණ විය. ඒ අනුව ගොවීන්, කාන්තාවන්, ධීවර කාර්මිකයින් වැනි විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන සේ වැඩසටහන් ආරම්භ කිරීමට හැකි විය.

9. ප්‍රජාවගේ සංවිධානාත්මක හැකියාවන් හා විශ්වාසයන් ගොඩ නගා ගැනීම ද වැදගත් අවශ්‍යතාවයකි. මේ සඳහා ප්‍රජාව සමග හොඳ සබඳතාවයක් වර්ධනය කර ගැනීමට අවශ්‍ය වන අතර "පහසුකම් සපයන්නෙකු" මගින් මේ කාර්ය වඩා පහසු වේ. මේ සඳහා විශ්වාසය, වගකීම හා අවංකභාවය පහසුකම් සපයන්නෙකුගේ පාර්ශ්වය විසින් සිදුවිය යුත්තකි. මෙම වැඩසටහනේ දී පහසුකම් සපයන්නෙකුගේ කාර්යභාරය හොඳින් සිදු නොවීම ප්‍රජාවගේ සහභාගිත්වය නො ලැබීමට එක් හේතුවක් විය.


**එන්.එස්.බී. ඇපාකන්ද**

*පර්යේෂණ නිලධාරී*

මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය



## 'ගොවි ජනතා'

'ගොවි ජනතා' සඟරාවේ පසුගිය කලාප කිහිපයක සීමිත පිටපත් සංඛ්‍යාවක් ඉතිරිව තිබේ. දැනට, මෙම කලාපයන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන අලෙවි කවුළුවෙන් / කුටියෙන් මිල දී ගැනීමේ හැකියාව පවතී.

දැනට ඉතිරිව තිබෙන කලාපයන්ගේ තේමාවන් අතර 'අලෙවිකරණ හැසිරීම් රටා', ජාතික ගොවි සතිය, ආහාර සතිය, නැගෙනහිර ප්‍රබෝධය, අපි වවමු - රට නගමු' යනාදිය වේ.

ඔබට අවශ්‍ය කලාප සංඛ්‍යාව සඳහන් කොට, අදාළ ගෙවීම් මුදල් ඇණවුමකින් ආයතනය වෙත ලැබෙන්නට සැලැස්වීමෙන් අවශ්‍ය පිටපත් ප්‍රමාණය ලබාගත හැකි ය.

**සියළු මුදල් ඇනවුම්**

අධ්‍යක්ෂ

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

114, විජේරාම මාවත,

කොළඹ - 07

දුරකතන: 011 -2696981, 2698539-41 දිගුව: 320